00011

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

අධ්‍යාපනවේදී (ස්වභාවික විද්‍යා) උපාධි වැඩසටහන-පස්වන මට්ටම 2018/2019

අවසාන පරීක්ෂණය - 2019

**ESU3114/STU5314 - අධ්‍යාපනයේ මාර්ගෝපදේශය හා උපදේශනය**

කාලය පැය තුනයි. (03)

---

දිනය - 2019.02.15 | වේලාව - පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා

---

**I වන කොටසේ සියළුම ප්‍රශ්නවලට ද, II වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.**

## <u>I වන කොටස</u>

01. උපදේශනයෙහි ප්‍රධාන ක්ෂේත්‍ර හතර (04) නම් කර එම ක්ෂේත්‍ර හතරෙහි අන්‍යෝන්‍ය සම්බන්ධිත බව පැහැදිලි කිරීම සඳහා එක් (01) උදාහරණයක් දෙන්න.

02. "ශිෂ්‍ය සමායෝගය" යන්නෙන් අදහස් වන්නේ කුමක් ද? කෙටියෙන් පැහැදිලි කරන්න.

03. ශ්‍රී ලාංකික පාසල් පද්ධතිය තුළ, මාර්ගෝපදේශ හා උපදේශන සේවා අවශ්‍ය වීමට හේතු තුනක් (03) කෙටියෙන් පහදන්න.

04. පාසල් මාර්ගෝපදේශය හා උපදේශන සේවා වැඩිදියුණු කිරීම සඳහා දායකත්වය දැක්වීම අවශ්‍ය වන වෘත්තිකයින් තිදෙනෙක් (03) නම් කර ඔවුන් විසින් ලබා දිය හැකි සේවා තුනක් (03) ලැයිස්තුගත කරන්න.

05. ගුරුවරයකු වෘත්තීය උපදේශන න්‍යාය පිළිබඳව දැනුවත් විය යුත්තේ මන් ද? ප්‍රධාන කරුණු දෙකක් (02) දක්වමින් පැහැදිලි කරන්න.

06. උපදේශන වෘත්තිය හා සම්බන්ධ ප්‍රධාන ආචාරධර්ම පහක් (05) සඳහන් කරන්න.

07. ඔබ උපදේශනය පිළිබඳ පුද්ගල කේන්ද්‍රීය ප්‍රවේශය පාසල් සන්දර්භය සඳහා නිර්දේශ කරන්නෙහි ද? ඔබගේ පිළිතුර කෙටියෙන් සාධාරණීකරණය කරන්න.

08. පාසල් වෘත්තීය පුස්තකාලයෙහි තිබිය යුතු භෞතික සම්පත් තුනක් (03) ලැයිස්තුගත කර පාසල් ශිෂ්‍යයින් සඳහා එම සම්පත්වල වැදගත්කම කෙටියෙන් පැහැදිලි කරන්න. (5 x 8 = ලකුණු 40)

## II වන කොටස

09. (i) "සමාජ නිෂ්ක්‍රමණය" යන පදයෙහි අර්ථය කෙටියෙන් පැහැදිලි කරන්න.
( ලකුණු 04)

(ii) ශ්‍රී ලාංකික සමාජ සන්දර්භය තුළ ළමයෙකුගේ සමාජ නිෂ්ක්‍රමණය සඳහා හේතු වන පාසල හා බැඳි සාධක දෙකක් **(02)** කෙටියෙන් විස්තර කරන්න.
(3 x 2 = ලකුණු 06)

(iii) ශ්‍රී ලාංකික සමාජ සන්දර්භය තුළ ශිෂ්‍යයින්ගේ සමාජ නිෂ්ක්‍රමණය අවම කිරීම සඳහා
(අ) ගුරුවරයෙකු හට
(ආ) පාසලට
යොදා ගත හැකි උපාය මාර්ග දෙක **(02)** බැගින් කෙටියෙන් පැහැදිලි කරන්න.
(5 x 2 = ලකුණු 10)

10. (i) පාසල් පද්ධතිය තුළ ක්‍රියාවට නැංවිය හැකි උපදේශන ශිල්ප ක්‍රම හතරක් **(04)** ලැයිස්තුගත කරන්න. (1 x 4 = ලකුණු 04)

(ii) ඔබ ඉහත (i) යටතේ සඳහන් කළ එක් (01) ශිල්ප ක්‍රමයක් තෝරා ගෙන පාසල් සන්දර්භය තුළ එම ශිල්ප ක්‍රමය භාවිතා කිරීමෙහි ඇති වාසි තුනක් **(03)** කෙටියෙන් විස්තර කරන්න. (2 x 3 = ලකුණු 06)

(iii) එම තෝරා ගත් ශිල්ප ක්‍රමය පාසල් සන්දර්භය තුළ භාවිතයෙහි දී සැලකිලිමත් විය යුතු වැදගත් කරුණු තුනක් **(03)** කෙටියෙන් පැහැදිලි කරන්න.
(ලකුණු 10)

11. (i) පාසල් ළමුන් තුළ මනා ලෙස සමායෝගී වූ පෞරුෂයක් සංවර්ධනය වීම කෙරෙහි තොරතුරු තාක්ෂණයෙහි නව සංවර්ධනය වීම් ඇති කරන අභියෝග හා තර්ජන කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ii) සමාජ මාධ්‍ය සදාචාරාත්මක ලෙස භාවිතා කිරීමට ශිෂ්‍යයන් හට මඟ පෙන්වීමෙහි දී පාසලක් විසින් මුහුණ දිය හැකි අභියෝග තුනක් **(03)** දක්වන්න. (2 x 3 = ලකුණු 06)

(iii) ළමුන් සදාචාර විරෝධී ලෙස සමාජ මාධ්‍ය භාවිතා කිරීම අවම කිරීම සඳහා පාසල් උපදේශන සේවාව විසින් යොදා ගත හැකි උපාය මාර්ග තුනක් **(03)** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 10)

12. (i) "සුහග දූර්වල සාධනයක් සහිත ළමුන්" යන පදය පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ii) සුහග දූර්වල සාධනයක් සහිත ළමුන්ගේ ප්‍රධාන ලක්ෂණ තුනක් **(03)** කෙටියෙන් විස්තර කරන්න. (2 x 3 = ලකුණු 06)

(iii) සුහග දූර්වල සාධනයක් සහිත ළමුන්ගේ සමස්ත සංවර්ධනය සුසාධ්‍ය කිරීම සඳහා පාසල විසින් යොදා ගත හැකි උපාය මාර්ග තුනක් **(03)** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 10)

13. (i) උපදේශනයේ මනෝ විශ්ලේෂණාත්මක ප්‍රවේශයෙහි මූලික දර්ශනය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ii) ෆ්‍රොයිඩියානු මනෝ විශ්ලේෂණාත්මක චිකිත්සාවෙහි අරමුණු දෙකක් **(02)** කෙටියෙන් පැහැදිලි කරන්න. (3 x 2 = ලකුණු 06)

(iii) උපදේශනයේ මනෝ විශ්ලේෂණාත්මක ප්‍රවේශයෙහි ප්‍රධාන සීමා තුනක් **(03)** විභාග කරන්න. (ලකුණු 10)

14. (i) "ඉගෙනුම් දුෂ්කරතා" සහ "ඉගෙනුම් නො හැකියා" යන සංකල්ප අතර ඇති වෙනස කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ii) ළමුන් තුළ ඉගෙනුම් දුෂ්කරතා ඇතිවීමට හේතු විය හැකි පාසල හා බැඳි සාධක දෙකක් **(02)** උදාහරණ දක්වමින් විස්තර කරන්න. (3 x 2 = ලකුණු 06)

(iii) ඉගෙනුම් දුෂ්කරතා සහිත ප්‍රාථමික පාසල් ශිෂ්‍යයින්ට උපකාර කිරීම සඳහා ගුරුවරයෙකු විසින් යොදා ගත හැකි උපාය මාර්ග තුනක් **(03)** පැහැදිලි කරන්න. (ලකුණු 10)

හිමිකම් ඇවිරිණි.

**THE OPEN UNIVERSITY OF SRI LANKA**

**FACULTY OF EDUCATION**

**BACHELOR OF EDUCATION (NATURAL SCIENCES)**

**DEGREE PROGRAMME**

**LEVEL - 05**

**FINAL EXAMINATION 2019**

**ESU3114/STU5314 – GUIDANCE AND COUNSELLING IN EDUCATION**

**DURATION – THREE (03) HOURS**

Date: 15.02.2019 Time: 9.30 a.m. – 12.30 p.m.

**Answer all questions in Part I and any three (03) questions from Part II.**

## PART - I

01. Name the **four (04)** major areas of counselling and give **one (01)** example to illustrate the inter-related nature of these four areas.

02. What is meant by the term "student adjustment"? Explain in brief.

03. Explain briefly **three (03)** reasons why guidance and counselling services are needed in the Sri Lankan school system.

04. Name **three (03)** professionals whose contribution is needed to improve the school guidance and counselling services and list **three (03)** services that could be rendered by them.

05. Why should a teacher be aware of theories of vocational/career counselling? Illustrate with **two (02)** key points.

06. Mention **five (05)** major ethics related to the profession of counselling.

07. Would you recommend the person-centred approach of counselling to the school setting? Justify your answer in brief.

08. List **three (03)** physical resources that should be made available in the school career library, and briefly explain the importance of those resources for school children.

(5 x 8 = 40 marks)

## PART - I

09. i. Explain in brief the meaning of the term "social withdrawal."

(04 marks)

ii. Describe in brief **two (02)** school-related factors that would result in a child's social withdrawal in the Sri Lankan social context.

(3 x 2 = 06 marks)

iii. Explain in brief **two (02)** strategies each that can be adopted by

(a) a teacher
(b) the school

to minimize students' social withdrawal in the Sri Lankan social context.

(5 x 2 = 10 marks)

10. i. List **four (04)** techniques of counselling that can be practised within the school system.

(1x4 = 4 marks)

ii. Select one (01) of the techniques you mentioned under (i) above, and describe in brief **three (03)** advantages of using that technique in the school setting.

(2 x 3 = 06 marks)

iii. Briefly explain **three (03)** important factors to be considered when using the selected technique in the school setting.

(10 marks)

11. i. Explain in brief the challenges and threats posed by new developments in information technology to the development of well-adjusted personalities in school children.

(04 marks)

ii. State **three (03)** challenges that a school would face in guiding students to use social media in an ethical way.

(2 x 3 =04 marks)

iii. Briefly describe **three (03)** strategies that can be adopted by the school counselling service to minimize children's unethical use of social media.

(10 marks)

12. i. Explain the term "gifted underachievers".

(04 marks)

ii. Describe in brief **three (03)** key characteristics of gifted underachievers.

(2 x 3 = 06 marks)

iii. Briefly describe **three (03)** strategies that can be adopted by the school to facilitate the total development of gifted underachievers.

(10 marks)

13. i. Briefly explain the basic philosophy of the psychoanalytic approach to counselling.

(04 marks)

ii. Explain in brief **two (02)** goals of the Freudian psychoanalytic therapy.

(3 x 2 = 6 marks)

iii. Examine **three (03)** key limitations of the psychoanalytic approach to counselling.

(10 marks)

14. i. Explain in brief the difference between the concepts "learning difficulties" and "learning disabilities".

(04 marks)

ii. Describe with examples **two (02)** school-related factors that could lead to learning difficulties in children.

(3x2= 06 marks)

iii. Explain **three (03)** strategies that can be adopted by a teacher to help primary school students with learning difficulties.

(10 marks)

*-Copyrights reserved-*